# 19 කිතු සමිඳුගේ සෙබළුන් වෙමු

**එපීස 6 : 13-20**

කිතුනුවෙකු ලෙස දිවි ගෙවීමට සූදනම් වන අපහට ඊට එරෙහි ප්‍රබලතම අභියෝගය එල්ල වනුයේ "නපුරා" ගෙනි. අප දැනුම්වත් ව මෙන් ම නොදැනුම්වත්ව ම වුව ද විවිධාකාර ස්වරූපයෙන් හා විවිධ මාර්ග ඔස්සේ "නපුර" අප වෙත පැමිණෙයි. නපුරාගෙන් එල්ල වන අභියෝගවලට සාර්ථක ව මුහුණ දීමේ ක්‍රමවේදය පාවුල් තුමා විසින් අප වෙත හඳුන්වා දෙනු ලබයි. ඒ එතුමා විසින් එපීස වැසියන් වෙත යවන ලද හසුන ඇසුරිනි.

ජුදෙව් නොවන ජාතීන් වෙත ශුභාරංචිය රැගෙන යාම සඳහා ස්වාමීන් වහන්සේ විසින් කැඳවන ලද සුවිශේෂ චරිතයක් ලෙස පාවුලු තුමා හැඳින්විය හැකි ය. ශුභාරංචිය ප්‍රකාශ කිරීම හේතු කොටගෙන එතුමා සිරභාරයට ගනු ලැබ දැඩි මුරකාවල් මැද රඳවා තබනු ලැබිණි. එතුමා එපීස වැසියන් වෙත යවනු පිණිස හසුනක් ලියුවේ එලෙස සිරභාරයේ සිටියේ දී ය. සිරගෙදර දී ඔහුට නිරන්තරයෙන් දක්නට ලැබුණ ආයුධ සන්නද්ධ සෙබළුන්ගේ ස්වරූපය සංකේතවත් කර ගනිමින්, එපීස වැසියන්ගේ "ආධ්‍යාත්මික සටන" ජය ගැනීම උදෙසා ඊට එරෙහි වන නපුරු බලවේග පරාජය කිරීමට සූදනම් කළ ආකාරය විමසා බලමු.

> *එබැවින් නපුරු දවස පැමිණි විට ඊට විරුද්ධ ව සිටින්න පුළුවන් වන පිණිසත්, කළ හැකි සෑම දෙයක් ම කර, ස්ථිර ව සිටින්න පුළුවන් වන පිණිසත්, දෙවියන් වහන්සේගේ සන්නාහයෙන් සන්නද්ධ ව සිටින්න.*
>
> *එපීස 6:13*

පාවුල් තුමාට අනුව කිතුනුවා මුහුණ දෙනු ලබන සටන කුමක් ද?

පාවුල් තුමා සෙබළුන්ගේ යුධ ආයුධ සංකේතාත්මක ව උපයෝගී කරගනිමින් ආධ්‍යාත්මික සටනක් සඳහා සැදැහැවතුන් සූදනම් කළේ ය. එය නපුරේ බලවේග සමග නපුරට විරුද්ධ ව කෙරෙන සටනකි.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

අද සමාජය තුළ ද නපුරු බලවේග විවිධ ස්වරූපයෙන් අප වෙත පැමිණෙයි. එවැනි අවස්ථා කිහිපයක් හඳුනාගනිමු.

- ★ සමහර මිතුරන් මගින් පැමිණෙන වැරදි පෙළඹවීම්
- ★ නවීන සන්නිවේදන උපකරණ වැරදි ලෙස භාවිතය
- ★ මත් ද්‍රව්‍ය, දුම්වැටි වැනි දේ කෙරෙහි පෙළඹවීම්
- ★ ගුරු දෙගුරුන්ගේ උපදෙස් පිළිපැදීමට දක්වන මැලිකම
- ★ පොදු සම්මතයන්ට හිස නැමීමට දක්වන මැලිකම

**විමසා බලමු**
**එපීස 6:14-17**

ඉහත බයිබල් පාඨය ඇසුරෙන් සැදැහැවතුන්ගේ යුද්ධායුධ මොනවාදැයි **අභ්‍යාස පොතේ** ලියා දක්වන්න.



## කිතුනු අපගේ සන්නාහ සන්නද්ධ ආයුධ

සත්‍යය නැමති ⟶ ඉඟපටිය

ඉඟපටිය මගින් යුද මෙවලම් ශරීරයට නිසි ලෙස රඳවා තබයි. කිතුනුවන් විසින් සිදු කෙරෙන ආධ්‍යාත්මික සටනේ දී කිසි ලෙසකින්වත් සත්‍යයෙන් ඉවතට නොයා යුතු බව මින් ප්‍රකාශ වේ. නිවැරදි සත්‍යය අපට පසක් කර දෙනු ලබන්නේ ශුද්ධ වූ දේව වචනයයි. මෙහි දී,



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

- ★ වංචනික ක්‍රියා ප්‍රතික්ෂේප කිරීම හා ඒවා තුරන් කිරීමට දායක වීමත්
- ★ ශුද්ධාත්මයාණන් හදවතට පවසන දෙයට සවන් දී සත්‍යවාදී ලෙස ක්‍රියා කිරීමත් වැදගත් වේ.

දැමිටුකම නැමති ⟶ ළය වැස්ම

යුධ සෙබළෙකුගේ වැදගත්ම ජීවිතාරක්ෂක මෙවලම වනුයේ ළය වැස්ම ය. එය ඔවුන්ගේ හදවත යම් ආයුධයකින් පසාරු කරගෙන යෑම වළක්වාලයි. අපගේ ජීවිත නපුරෙන් විනාශ වීම වළක්වා ගැනීම උදෙසා අප ජීවිත තුළ ධර්මිෂ්ඨ බව නිරන්තරයෙන් පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ.

- ★ නපුරට විරුද්ධ ව සටන් කළ යුත්තේ ධර්මිෂ්ඨකම පෙරදැරි කරගෙන වේ.
- ★ එනිසා අපගේ ජීවිත දැහැමි බවින් පුරවා ගැනීමට උත්සාහ කළ යුතු වේ.
- ★ දැහැමි බව මගින් ස්වර්ග රාජ්‍යයට පිවිසීමේ උරුමකම හිමි වේ.
- ★ දැහැමි මාර්ගයේ ගමන් කරන්නාට බොහෝ බාධක ඇති වුවත් අවසානයේ ඔහුට තම ජීවිතය සාර්ථක කරගත හැකි වේ.

සාම සුබ අස්න නැමැති ⟶ වහන්

ශුභාරංචිය ලොව පුරා රැගෙන යාම කිතුනු අපගේ වගකීමයි. වහන් පයලා ගැනීමෙන් අර්ථවත් වන්නේ ගමනේ යෙදීමයි. සාම සුබ අස්න ලොව පුරා ගෙන යාහැකි ආකාර කිහිපයක් විමසා බලමු.

- ★ ජේසු තුමාගේ උපත මගින් ලෝකයට සාමය උදා වූ ආකාරය ප්‍රචලිත කිරීම
- ★ ශුභාරංචිය ලෝකයාට දායාද කිරීම කිතුනු අපගේ වගකීම යන හැඟීමෙන් කටයුතු කිරීම
- ★ ජීවිතාදර්ශය ශුභාරංචිය අන් අය වෙත ගෙන යෑමේ සුදුසුතම මග බව සලකා ජීවත් වීම.

ඇදහිල්ල නැමති ⟶ පලිහ

පලිහ යොදගනු ලබන්නේ සතුරු ප්‍රහාර වළක්වා ගැනීම පිණිස ය. ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි පවතින ඇදහිල්ල මගින් අප වෙත පැමිණෙන පරීක්ෂා ජයගත හැකි වේ. එම නිසා

- ★ සෑම මොහොතක ම අප සතු ව විශ්වාසය නැමති පලිහ තබා ගැනීමට අවශ්‍ය වේ.
- ★ අපගේ ජීවිතයේ අවසාන මොහොත දක්වා දේව විශ්වාසය තුළ ක්‍රියා කිරීම වැදගත් වේ.
- ★ විවිධ බාධක, අභියෝග හමුවේ වුව ද විශ්වාසය රැක ගැනීමට නිරතුරු ව ම උත්සාහ දැරීම කළ යුතු වේ.

ගැලවීම නැමති ⟶ හිස්වැස්ම

යුධ සෙබළකු හිස් වැස්ම පලඳින්නේ බුද්ධිමත් ව, සිහි කල්පනාවෙන් යුතු ව තම වගකීම් ඉටුකරලීම පිණිස තම හිස ආරක්ෂා කර ගැනීම සඳහා වේ. කිතුනු අපහට එය මෙලෙස අදාළ කරගත හැකි වේ.

- ⋆ හිස ශරීරයේ ප්‍රධාන අවයවය වන්නා සේ කිතුනු දිවියේ ප්‍රධාන අරමුණ වන්නේ පාපයෙන් ගැලවීම ය.
- ⋆ හිස් වැස්මකින් හිස ආරක්ෂා කරන්නාක් මෙන් කිතුනු දිවියේ පැවැත්ම ආරක්ෂා වන්නේ පාපයෙන් ගැලවීම මත ය.
- ⋆ අප අපගේ ජීවිත මෙන් ම අන් අයගේ ජීවිත ද පාපයෙන් ගලවා ගැනීමට උත්සාහ දැරීම අපගේ වගකීම වේ.

ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් වන දේව වචනය නැමැති ⟶ කඩුව

සතුරාගෙන් ආරක්ෂා වීමට හා සතුරා මැඬලීම උදෙසා කඩුව උපයෝගී කර ගන්නා සේ අපගේ කිතුනු දිවියේ පැවැත්ම උදෙසා හා නපුර මැඬලීම උදෙසා උපයෝගී කර ගත යුතු වන්නේ දේව වචනයයි.

- ⋆ දේව වචනය නැමැති තියුණු බවින් යුත් කඩුවෙන් ජීවිතයේ අපිරිසිදු තැන් වෙන් කර ඉවත් කිරීමට මගපෙන්වයි.
- ⋆ සතුරා පරාජය කිරීමට කඩුව භාවිත කරන්නාක් මෙන් අපගේ ජීවිතවලට පැමිණෙන නපුර පරාජය කිරීමට ද දේව වචනය යොදා ගනිමු.
- ⋆ ජේසුස් වහන්සේ මෙන් පරීක්ෂා හමුවේ දේව වචනය උපයෝගී කර ගනිමින් පාපයට නොවැටී සිටීමට උත්සාහ ගනිමු.

ඉහත සඳහන් ලෙස සන්නාහයෙන් සන්නද්ධ වන කිතුනුවා ජේසුස් වහන්සේගේ සෙබළෙකු බවට පත් වේ. මෙහි දී කිතුනුවා විසින් සිදු කරනු ලබන්නේ නපුරට විරුද්ධ ව කෙරෙන සටනකි. එවැනි සෙබළෙකු සතු විය යුතු ප්‍රධාන ගුණාංගය විය යුතු වනුයේ යාච්ඤාවයි. එය එපීස 6:18-2 ඇසුරින් මෙසේ හඳුනා ගත හැකි වේ.

**එවැනි සෙබළකු සතු විය යුතු යාච්ඤාව පිළිබඳ ව එපිසවරුන්ට දෙන ලද උපදෙස්**

- මුළු සිතින් ම යාච්ඤා කිරීම
- ශුද්ධාත්ම බලය කෙරෙහි විශ්වාසය තබමින් යාච්ඤා කිරීම
- අවදි ව නොකඩවා යාච්ඤාවේ යෙදීම
- දෙවියන් වහන්සේගේ සෙනඟ උදෙසා යාච්ඤා කිරීම
- දේව මෙහෙවරෙහි යෙදෙන අය වෙනුවෙන් යාච්ඤා කිරීම



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

ජේසුස් වහන්සේ වෙනුවෙන් සිරගත ව සිටිය දී පවා පාවුල් තුමා විශ්වාස කළේ තමා නිරතුරු සැම තැනක ජේසුස් වහන්සේගේ නානාපතිවරයෙකු ලෙසට පත්කර තිබෙන බවයි. එතුමා තම සේවා සටනේ දී ක්‍රිස්තුස් වහන්සේට අයත් අභීත යුධ සෙබළකු සේ ක්‍රියා කළේ ය.

එවැනි අභීත යුධ සෙබළුන් මෙන් සැදැහැවතුන්ගේ යුද්ධායුධ පැළඳ ගනිමින්, නපුරේ බලවේගයන්ට එරෙහි ව සටන් කරමින් ක්‍රිස්තුස් වහන්සේගේ නානාපතිවරුන් සේ ක්‍රියා කිරීමට උන්වහන්සේ අපට ද ආරාධනා කරන සේක.

**ක්‍රියාකාරකම්**

1. කිතුනුවන් තම සටන දියත් කළ යුත්තේ කුමකට එරෙහි ව ද?
2. සමිඳුන්ගේ සේනාවේ යුද සෙබළකු ලෙස ඔබ කිතුනු මෙහෙවරෙහි යෙදෙන ආකාරය විස්තර කරන්න.